**වීරකැටිය ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

වීරකැටිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මුදල් තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට වීරකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.492,772 ක් හා මුද්දර ගාස්තු ආදායම රු. 15,425,876 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | උසාවි දඩ ආදායම් ලැබීම අවිනිශ්චිත නිසා ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත නොකළ බව සහ මුද්දර ගාස්තු උපලේඛන 2023 වර්ෂයේදී ලද නිසා ගිණුම්ගත නොකළ බව. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලැබී තිබූ රු. 7,603,683 ක් වූ එක්වන් මුදල් ආදායමක් ලෙස ගිණුම්ගත නොකර තැන්පතුවක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව වසර 5 අඩු එක්වන් මුදල් තැන්පතුවක් ලෙස ගිණුම්ගත කරන බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී වීථි පහන් නඩත්තුව වෙනුවෙන් දරන ලද රු.1,864,295 ක පුනරාවර්ථන වියදම ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | දිගු කාලයක් ප්‍රතිලාභ අපේක්ෂාවෙන් දරන ලද ප්‍රාග්ධන ස්වරූපයේ වියදමක් වන බැවින් ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කළ බව. | වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සේවක ණය වටිනාකම රු. 782,005 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | ලැබිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී වීරකැටිය හෙලබොජුන් හලෙහි ඇලුමිනියම් තහඩු හා වීදුරු යොදා වෙන්කිරීම වෙනුවෙන් වැයකළ රු. 554,500 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කරන බව. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී බදුදී තිබූ පස්මංහන්දිය කඩ කාමරයක් සඳහා ලැබිය යුතු එක්වන් මුදල් රු. 200,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව සහ ලැබිය යුතු එක්වන් මුදලින් රු. 100,000 ක් අයකරගත් බව. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී ස්ථිර කාර්යය මණ්ඩල සඳහා ගෙවන ලද වැටුප් හා මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණය කර ගැනීමේදී වැඩියෙන් ලද රු. 58,448 ක් ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නැවත ප්‍රතිපූර්ණය කර ගැනීමේදී වැඩියෙන් ලද මුදල් ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කරන බව. | ගෙවිය යුතු ශේෂයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | i. | 23 හා 24 වගන්ති | යොමුගත රීතිය ප්‍රකාරව සභා මාර්ග පිළිබඳ විස්තර ඇතුළත් මාර්ග ඉන්වෙන්ට්‍රියක් 2023 මාර්තු 23 දින වන විටත් සකස් කර නොතිබුණි. | විධිමත්ව මාර්ග ඉන්වෙන්ට්‍රිය සකස් කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | ii. | 134 (2) වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු කළ ප්‍රදේශ වාර්ෂිකව හඳුනාගෙන වරිපනම් බල ප්‍රදේශය සංශෝධනය කරගත හැකි වුවත්, 1973 වර්ෂයේදී හඳුනා ගත් දියුණු කළ ප්‍රදේශ සඳහා පමණක් සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් බදු අයකර තිබුණි. | දියුණු කල ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා සමීක්ෂණ කරමින් පවතින අතර ඉදිරියේදී දියුණු කළ ප්‍රදේශ හඳුනා ගනිමින් ගැසට් කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | i. | මුදල් රෙගුලාසි 177(1) | වීරකැටිය හෙළබොජුන්හලෙන් දෛනිකව ආදායම් රැස්කිරීමට පත්කල සේවකයා විසින් අවස්ථා 11 කදී රැස්කළ රු. 110,544 මුදල් කාර්යාලයට ප්‍රේෂණය නොකර රැස්කළ දින සිට දින 01 ත් දින 15 ත් අතර කාලයක් අත රඳවාගෙන තිබුණි. | දෛනිකව ලැබෙන ආදායම් රැස්කර එම මුදල් කාර්යාලය වෙත ප්‍රේෂණය කිරීමේ රාජකාරි කටයුතු 2023 අප්‍රේල් 10 දින සිට ආදායම් ප්‍රවර්ධන නිලධාරි වෙත පවරා ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (iv) වගන්තිය | අතිකාල හා නිවාඩු දින වැටුප් ආදි නිත්‍ය රාජකාරි වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සනාථ කිරීම කළ යුතු වුවත්, 2022 වර්ෂයේදී ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම සනාථ කර නොගෙන දින 60 ක් වෙනුවෙන් නිලධාරනියකට රු.137,013 ක නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | ඇඟිලි සලකුණු යන්ත්‍රය අක්‍රිය බැවින් ඉදිරියේදී නව යන්ත්‍රයක් මිලදී ගැනීමට කටයුතු කරන බව හා ඒ අනුව කටයුතු කරන බව. | අත්‍යාවශ්‍ය කටයුත්තක් සේ සලකා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදී ගතයුතුය. |

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,592,388 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 21,423,227ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,284,000 | 3,857,349 | 4,348,772 | 5,519,094 | 5,299,000 | 2,936,609 | 2,234,028 | 6,010517 |
| කුලී | 28,371,000 | 27,392,546 | 25,761,670 | 19,290,045 | 20,612,000 | 20,485,220 | 7,973,036 | 17,659,169 |
| බලපත්‍ර ගාස්තු | 1,200,000 | 2,667,535 | 2,527,305 | 563,475 | 1,160,000 | 989,050 | 544,594 | 423,244 |
| වෙනත් ආදායම් | 4,965,500 | 10,308,815 | 10,308,815 | - | - | - | - | - |
| **එකතුව** | **37,820,500** | **44,226,245** | **42,946,562** | **25,372,614** | **27,071,000** | **24,410,879** | **10,751,658** | **24,092,930** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 2670 කින් ලැබිය යුතු වරිපනම් බදු රු. 5,019,165 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී දේපල තහනම් කිරීමේ නිවේදන නිකුත් කරමින් හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ආ). | ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (ආ) වගන්තිය ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, හිඟය රු. 5,000 ට වැඩි දේපල හිමියන් 185 කින් ලැබිය යුතු වරිපනම් බදු රු. 1,511,993 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ඉදිරියේදී නොගෙවූ රතු නිවේදන වෙනුවෙන් දේපල තහනම් කිරීමට කටයුතු කරන බව. | වටිනාකමින් වැඩි හිඟ ශේෂ කඩිනමින් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 116 කින් ලැබිය යුතු ව්‍යාපාර බදු රු. 360,600 ක් හා ව්‍යාපාර ඒකක 33 කින් අයවිය යුතු කර්මාන්ත බදු රු. 31,500 ක් විය. | හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඈ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරු කරන පනතේ 20 වන වගන්තිය පරිදි වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදීත් 2002 වර්ෂයේ තක්සේරුව මත වරිපනම් බදු අයකර තිබුණි. | 2018 වර්ෂයේදී නව තක්සේරුවක් සිදු කලද 2020 වර්ෂයේදී ලද තක්සේරු විරෝධතා හා රටේ පැවති කොරෝනා වසංගත තත්වය නිසා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු විරෝධතා සලකා බැලීම සිදු කල නොහැකි බවට ලිඛිතව දන්වා තිබීම හේතු වූ බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩ කාමර 19 කින් ලැබිය යුතු කඩ කුලී රු. 174,650 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොල බදු රු. 18,564,700 ක් හා සභාව සතු යන්ත්‍රෝපකරණ කුළියට දීම වෙනුවෙන් ලැබිය යුතු රු. 550,696 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 5,937,274 ක් සඳහා නඩු පවරා ඇති අතර රු. 2,591,279 ක් කපා හැරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට ඉදිරිපත් කළ බවත් යන්ත්‍ර කුළී ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | ආදායම් හා හිඟ ආදායම් නියමිත වේලාවට ආදායම් පරීක්ෂකවරු අයකළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රථ වාහන නැවතුම් පොළ ගාස්තු රු. 490,475 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.452,983 ක් කපා හැරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට ඉදිරිපත් කළ අතර රු.129,200 ක් සඳහා අනුමැතිය ලද බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

**2.3 මෙහෙයුම් අකාරයක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ගොඩනැගිලි සංවර්ධන බලපත්‍ර 502 ක් සභාව විසින් අනුමත කර තිබුණද ගොඩනැගිලි 50 ක් සඳහා පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබූ අතර ඉතිරි ගොඩනැගිලි සම්බන්ධයෙන් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 10 (6) වගන්තිය අනුව සහ විපරම් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී මෙම ගැටලුකාරී තත්වය මගහරවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව . | තාක්ෂණික නිළධාරි විසින් පරීක්ෂා කර පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති අංක PE/01/01 දරන ලිපිය ප්‍රකාරව වීථි පහන් ස්ථාපනය නොකිරීම මත සමාලෝචිත වර්ෂයේදී වීථි පහන් නඩත්තුව වෙනුවෙන් වියදම් කළ රු. 4,633,416 ක් විදුලිබල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය වී නොතිබුණි. | සභා බල ප්‍රදේශය තුළ ග්‍රාම නිලධාරී වසම් 112 ක් තිබෙන අතර ඉන් වසමක වීථි පහන් සමීක්ෂණය සිදු කළ අතර ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගිවිසුම්ගත වීම සඳහා ලිඛිතව දැනුවත් කළ අතර මේ දක්වා ගිවිසුම්ගත නොවූ බව. | ලිපිය අනුව කටයුතු කිරීම සහ වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩව සහා ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි පරිශ්‍රය පිරිසිදු කිරිමේ සේවාව බාහිර ආයතනයකින් ලබාගන්නා අතර 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා දරන ලද එකතු වියදම රු. 1,584,000 ක් විය. සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය තුළ අතිරික්ත කම්කරුවන් 09 ක් සිටියද ඔවුන් යොදවාගෙන මෙම කාර්යය ඉටුකරගත හැකිව තිබියදී බාහිර පාර්ශවයකින් එම සේවාව සපයා ගැනීම මත දරන ලද මුළු වියදමම අනාර්ථික ගණුදෙනුවක් විය. | දෛනිකව පොදු කටයුතු සඳහා කම්කරු අවශ්‍යතාවය 26 ක් වන නිසා කාර්යාල පරිශ්‍රය දිනපතා පිරිසිදු කිරීම සඳහා ආයතනයේ සිටින සෞඛ්‍ය කම්කරුවන් 21 යොදවා ගැනීමට නොහැකි බව. | සිටින සේවකයන් කළමණාකරනය කර සේවාවන්වලට යෙදවීමට කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී වෙළඳ බලපත්‍ර ලබාගෙන තිබුණු ව්‍යාපාර ආයතන 11 ක් පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ව්‍යාපාර ආයතන 04 ක් වසා ඇති බව, 04 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර දුන් බව හා 03 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගන්නා මෙන් ලිපි යොමු කළ බව. | ව්‍යාපාර ආයතන පරිසර බලපත්‍ර ලබාගැනීමට උනන්දු කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 15 දින සිට උඩුකිරිවල වැව ආශ්‍රිතව හංස බෝට්ටු සේවා ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම සභාව විසින් ආරම්භ කර පෞද්ගලික පාර්ශවයකට බෝට්ටු සේවාව කරගෙන යාමට ඉඩදී දෛනික ආදායමෙන් සියයට දහයක් සභාව අයකරගෙන තිබුණි. එහෙත් එම ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘති වාර්තාව සඳහා දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර සේවා ගිවිසුමකට එළඹ නොතිබුණි. | ව්‍යාපෘතියට අනුමැතිය ලබාගැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට නැවත සිහි කැඳවීම් ලිපියක් යොමුකළ බව. | ව්‍යාපෘති වාර්තාව සඳහා අනුමැතිය ලබාගැනීම අතුරු ව්‍යවස්ථාවන් පනවා ගැනීම සහ සේවා ගිවිසුමකට එළඹීමටද කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 ජුනි 27 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව සභාවේ සේවය කර විශ්‍රාම ගිය හා වැඩ තහනමට ලක්වූ සේවකයින් තිදෙනෙකුගෙන් ලැබිය යුතු රු. 158,802 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව වෙත ලැබී වසර 07 ත් වසර 42 ත් අතර කාලයක් ගතවූ වාහන හා යන්ත්‍ර උපකරණ 05 ක, ඉඩම් හා ගොඩනැගිලි 16 ක හා සුසාන භූමි 23 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | වාහන වල අයිතිය හඳුනාගෙන පවරා ගැනීමට සහ ඉඩම් , ගොඩනැගිලි හා සුසාන භූමි පවරාදෙන මෙන් ඉල්ලීම් කළ බව. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට අදාළව 2021 අප්‍රේල් 21 දිනැති අංක 38 අතිරේකය මඟින් කරනු ලැබූ සංශෝධනය අනුව රු. 500,000 ඉක්මවන වාහන අලුත්වැඩියා සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එපරිදි කටයුතු නොකර කැබ් රථයකට 2022 අප්‍රේල් මස සිදුකළ අලුත්වැඩියාව සඳහා රු. 1,241,852 ක වියදමක් සභා අරමුදලින් දරා තිබුණි. | ඉදිරියේදී සිදු කරනු ලබන මෙවැනි අලුත්වැඩියා කටයුතු සඳහා අදාල අනුමැතිය ලබාගෙන නිවැරදිව සිදු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |